සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Second Term Test – January 2022

දෙවන වාර පරීක්ෂණය - 2022 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1hour

## Civic Education – I

| 62 | S | I |
|---|---|---|

## පුරවැසි අධ්‍යාපනය – I

Name :- ................................................... Grade : -................ Index number:-....................

❖ **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ දී ගැටලුවක් වන්නේ,
   (1) රාජ්‍යයක විවිධ පක්ෂ තිබීම
   (2) රටේ පුරවැසියන්ගේ ආදායම් විෂමතාවය
   (3) ජනගහනය අධිකවීම
   (4) නියමිත කාලයට මැතිවරණ පැවැත්වීම

2. ''නීතිය යනු පරමාධිපත්‍ය දේශපාලන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ආඥාවක් වන අතර එය කඩ කිරීම දඬුවමට හේතුවේ''
   (1) ජෝන් ඔස්ටින් (2) ටී.එච්.ග්‍රීන්
   (3) මයිකල් ඇල්බි (4) කිංඩල් බර්ෂ්

3. බහු සංස්කෘතික සමාජයක සහජීවනයෙන් කටයුතු කිරීම වඩාත් වැදගත් වීමට හේතුව කුමක් ද?
   (1) ජාතීන් අතර සහජීවනය ඇතිවීම
   (2) ජාතියක් ලෙස නැගී සිටීමට හැකිවීම
   (3) විදේශීය රාජ්‍ය ආක්‍රමණය කළ හැකිවීම
   (4) අනෙකුත් සංස්කෘතින්ට උදව් කළ හැකිවීම

4. පුරවැසියන්ගෙන් මධ්‍යම ආණ්ඩුව පළාත් සභා පළාත් පාලන ආයතන කෙරෙහි ඉටුවිය යුතු යුතුකමක් වන්නේ,
   (1) මහජන උපයෝගීතා සේවා සංවිධානාත්මකව ඉටු කිරීම
   (2) නීතිරීති ප්‍රඥප්ති සකස් කිරීම
   (3) මානව සම්පත් සංවර්ධනය හා යහපත් නායකයෙක් බිහි කිරීම
   (4) සමාජ සංවර්ධනයට හා යහපාලනයට දායක වීම

5. සර්වජන ඡන්දබල, පළාත්බද නියෝජනය වැනි ලාංකීය දේශපාලන ඉතිහාසයේ ප්‍රගතිශීලී යෝජනා රැසක් ඉදිරිපත් වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,
   (1) කෲව් මැකලම් ආණ්ඩුක්‍රමය
   (2) සෝල්බරි ආණ්ඩුක්‍රමය
   (3) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය
   (4) මැනිං ආණ්ඩුක්‍රමය

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

6. අධිකරණයේ බලතල හා කාර්යයක් නොවන්නේ,
   (1) අනාගත පාලකයන් පුහුණු කිරීම
   (2) යුක්ති පසිඳලීම
   (3) පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
   (4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම

7. සම්පත් විසංතුලනය ලෙස හඳුන්වන්නේ,
   (1) එකම ස්ථානයක සම්පත් ඒකාරාශී වීමයි
   (2) ලෝකයේ පවතින සම්පත් හිඟයයි
   (3) සම්පත් සමාන ලෙස ව්‍යාප්ත වීමයි
   (4) සම්පත් අසමාන ලෙස ව්‍යාප්ත තිබීමයි

8. පුද්ගලයෙකුගේ විවාහය හෝ වාණිජ කටයුතු සම්බන්ධයෙන් දඬුවම් පැමිණවිය හැකි නීතිය වන්නේ,
   (1) උඩරට නීතිය
   (2) අපරාධ නීතිය
   (3) අන්තර්ජාතික නීතිය
   (4) සිවිල් නීතිය

9. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමේදී පාලන ඒකක නිවැරදිව පෙළ ගස්වා ඇති පිළිතුර වනුයේ,
   (1) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,මධ්‍යම ආණ්ඩුව,නගරසභාව
   (2) මධ්‍යම ආණ්ඩුව,පළාත් සභාව,පළාත් පාලන ආයතන
   (3) නගර සභාව,පළාත් සභාව,පළාත් පාලන අයාතන
   (4) පළාත් සභාව,ප්‍රාදේශීය සභාව,මධ්‍යම ආණ්ඩුව

10. සංවර්ධිත රටවල් මුහුණ පාන ගැටලුවක් නොවන්නේ,
   (1) ස්වභාවික විපත් අඩුවීම
   (2) පරිසර දූෂණය
   (3) අමුද්‍රව්‍ය ලබා ගැනීම
   (4) ජාත්‍යන්තර ත්‍රස්තවාදය

11. වායු දූෂණයෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵලයක් වන්නේ,
   (1) සමාජ දුරාචාර වැඩිවීම
   (2) මුහුදු ජල මට්ටම පහළ යාම
   (3) අම්ල වැසි ඇතිවීම
   (4) මින් කිසිවක් සිදු නොවේ

12. අජෛව පරිසරයේ සාධක පමණක් ඇති පිළිතුර තෝරන්න.
   (1) දේශගුණය, පස්, මිරිදිය, ජලය
   (2) මිනිසා, පාෂාණ, ක්ෂුද්‍රජීවීන්
   (3) උරුම, සත්තු, ශාක
   (4) දේශගුණය, මිනිසා, සත්තු

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

13. වායු දූෂණයට බලපාන ස්වභාවික ක්‍රමයක් වන්නේ,

(1) භූමි කම්පා ඇතිවීම (2) වනාන්තර විනාශ කිරීම
(3) අපද්‍රව්‍ය බැහැර කිරීම (4) දූවිලි කුණාටු ඇතිවීම

14. ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පැමිණිලි විභාග කිරීමේ බලය හිමි අධිකරණය වන්නේ,

(1) ශ්‍රේෂ්ඨාධිකරණයයි (2) අභියාචනාධිකරණයයි
(3) දිසා අධිකරණයයි (4) මහාධිකරණයයි

15. ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස සැලකෙන්නේ,

(1) ස්විස්ටර්ලන්තය (2) ඉන්දියාව
(3) බ්‍රිතාන්‍ය (4) ග්‍රීසිය

16. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව සංවෘත ලැයිස්තුවට අයත් විෂය සඳහන් වරණය වන්නේ,

(1) කෘෂිකර්ම හා ගොවිජන සේවා කටයුතු
(2) පළාත් පාලන හා නිවාස සංවර්ධන කටයුතු
(3) සමාජ සේවා හා පුනරුත්ථාපන කටයුතු
(4) ජාතික ආරක්ෂාව හා විදේශ කටයුතු ය

17. නිදහස් හා සාධාරන මැතිවරණයක,

(1) ඡන්ද දායකයන්ට බලපෑම් කරන දේශපාලන බලවේග ඇත.
(2) දූෂණ වංචා බහුල ය
(3) ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ බහුල ය
(4) රාජ්‍ය සම්පත් ප්‍රචාරක කටයුතු වලට යොදා ගැනීම සිදුවේ

18. මානව හිමිකම් කොමිසම් සාමාජිකයන් පත්කරනු ලබන්නේ,

(1) අග්‍රාමාත්‍යවරයා ය (2) ජනාධිපතිවරයා ය
(3) පොලිස්පතිතුමා ය (4) නීතිපතිතුමා ය

19. පහත ප්‍රකාශ කියවන්න.

E - ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 3500ට වඩා වැඩියි
F - ළදරු මරණ අනුපාතය පහළ අගයක් ගන්නා අතර ජන සංඛ්‍යා වර්ධන වේගය ඉහළ මට්ටමක පවතී
G - ඉහළ සාක්ෂරතා ප්‍රතිශතයක් පවතී
H - මානව සංවර්ධන දර්ශකය 0.8ට වඩා වැඩියි

සංවර්ධිත රටවල ලක්ෂණ පිළිබඳ ඉහත ප්‍රකාශන සලකා බැලීමේදී වඩාත් නිවැරදි වරණය තෝරන්න.

(1) E,F,G,H පිළිතුරු සියල්ල නිවැරදියි
(2) E,G,H පමණක් නිවැරදියි
(3) E,F,H පමණක් නිවැරදියි
(4) F,G,H පමණක් නිවැරදියි

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

20. විසිරී ඇති නිෂ්පාදන සාධක එකලස් කරමින් සිදුකරන ක්‍රියාවලිය,
    (1) ශ්‍රමය යෙදවීම (2) ප්‍රාග්ධනය යෙදවීම
    (3) ව්‍යවසායකත්වය (4) බෙදා හැරීම

21. පුද්ගල වුවමනා,
    (1) අසීමිතය
    (2) විවිධ වේ
    (3) සමාජ ආර්ථික තත්ත්ව අනුව විවිධ නොවේ
    (4) ඉටුකර ගැනීමට සම්පත් ප්‍රමාණවත්ව ඇත.

22. පළාත් සභා මැතිවරණයකදී ඡන්ද කොට්ඨාසයක් ලෙස සැලකෙන්නේ,
    (1) පළාත (2) දිස්ත්‍රික්කය
    (3) ග්‍රාමනිලධාරී වසම (4) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය

23. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු විසින් ඉටුකළ යුතු නීතිමය යුතුකමක් වන්නේ,
    (1) විශේෂ අවශ්‍යතා ඇති අයට උදව් කිරීම
    (2) ගුරුවරුන්ට ගරු කිරීම
    (3) සිරිත් විරිත් ආරක්ෂා කිරීම
    (4) පොදු දේපොල ආරක්ෂා කිරීම

24. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,
    (1) අගමැතිවරයා ඇතුළු අමාත්‍ය මණ්ඩලයයි.
    (2) ජනාධිපතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලයයි
    (3) ජනාධිපතිවරයා හා මන්ත්‍රී මණ්ඩලයයි
    (4) කථානායක ඇතුළු ආණ්ඩුපක්ෂ මන්ත්‍රී කණ්ඩායමයි

25. ස්විස්ටර්ලන්තය තුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩුව හඳුන්වනු ලබන්නේ,
    (1) ප්‍රාන්ත ලෙස ය (2) කැන්ටන් ලෙස ය
    (3) සභා ලෙස ය (4) ජනපද ලෙස ය

26. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුවේ බලතලයක් අඩංගු පිළිතුර වන්නේ,
    (1) නිවාස හා ඉදිකිරීම් (2) සෞඛ්‍ය
    (3) බදුපැනවීම හා රුස්කිරීම (4) මූල්‍ය කටයුතු

27. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටක පාලන කටයුත්තක දී ඍජුවම ඡන්ද දායකයන්ගේ අදහස් විමසීමකට ලක් කරන අවස්ථාවකට නිදසුනකි.
    (1) ජනාධිපතිවරණය (2) ජනමතවිචාරණය
    (3) මහමැතිවරණය (4) පළාත් පාලන මැතිවරණය

28. ගැටලුවක් විසඳාගැනීමට සාකච්ඡා, ක්‍රමය මඟින් අපොහොසත් වන විට එය විසඳා ගැනීමට උපකාරී වීම හඳුන්වන්නේ,
    (1) මැදිහත්කරණය ලෙයසි (2) සහමන්ත්‍රණය ලෙසයි
    (3) කේවල් කිරීමයි (4) සමථකරණයයි

29. ලෝක ජල දූෂණය සඳහා වැඩිම බලපෑමක් ඇතිකරන සංසිද්ධිය වනුයේ,
    (1) ගිනිකඳු පිපිරීම
    (2) පතල් කැණීමෙන් ජලය අපවිත්‍රවීම
    (3) අම්ල වැසි ඇතිවීම
    (4) කාර්මික අපද්‍රව්‍ය ජලයට එක් වීම

30. මානව අයිතිවාසිකම් යටතේ සිවිල් අයිතිවාසිකමක් සඳහන් වන පිළිතුරු වනුයේ,
    (1) වෘත්තීය සමිති පිහිටුවා ගැනීමේ අයිතිය
    (2) අධ්‍යාපනය ලැබීමට අයිතිය
    (3) වැඩ කිරීම හා වැටුප් ලැබීමේ අයිතිය
    (4) නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස පිළිගැනීම

31. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කරනු ලබන්නේ,
    (1) මැතිවරණ කොමිෂන් සභාව මඟිනි
    (2) පාර්ලිමේන්තුව මඟිනි
    (3) රාජ්‍ය සේවා කොමිසම මඟිනි
    (4) සීමා නිර්ණ කොමිෂන් සභාව මඟිනි

32. ආර්ථික හා ආර්ථික නොවන භාණ්ඩයක් පිළිවෙළින් දැක්වෙන්නේ,
    (1) ඇඳුම්, හිරුඑළිය (2) ආහාර, ඇඳුම්
    (3) ජලය, වාතය (4) ඇඳුම්, ඖෂධ

33. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය සම්මත කර ගැනීම සඳහා බලපෑ ආසන්නම හේතුව වන්නේ,
    (1) ප්‍රංශ විප්ලවය (2) රුසියන් විප්ලවය
    (3) පළමු ලෝක යුද්ධය (4) දෙවන ලෝක යුද්ධය

34. සංවර්ධනය වෙමින් පවතින රටවල් පමණක් දැක්වෙන පිළිතුරු තෝරන්න.
    (1) බංගලාදේශය, සියොරාලියෝන්, ප්‍රංශය
    (2) ඉන්දියාව, බංගලාදේශය, චීනය
    (3) ඉන්දියාව, සෝමාලියාව, ජපානය
    (4) ඉන්දියාව, බංගලාදේශය, සියොරාලියෝන්

35. කලාපීය වෙළෙඳාම පුළුල් කිරීම අරමුණින් පිහිටුවා ඇති සංවිධානය වන්නේ,
    (1) SAPTA සංවිධානය (2) EU සංවිධානය
    (3) BIMST-EC සංවිධානය (4) NAFTA සංවිධානය

36. ශ්‍රී ලංකාවේ ජනවර්ග අනුව ජනගහනය වැඩිම ප්‍රතිශතයේ සිට අඩුම ප්‍රතිශතය දක්වා පෙළ ගැස්සීමේදී නිවැරදි පිළිතුර වන්නේ,
    (1) සිංහල, ශ්‍රීලංකා දෙමළ, ශ්‍රීලංකායෝනක
    (2) සිංහල, ඉන්දියානු දෙමළ, ශ්‍රී ලංකා යෝනක
    (3) සිංහල, වෙනත්, ශ්‍රී ලංකා යෝනක
    (4) සිංහල, ශ්‍රී ලංකා යෝනක, ශ්‍රී ලංකා දෙමළ

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

37. පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතකට යොමු කිරීම සම්බන්ධයෙන් වැඩි වගකීමක් පැවරෙනුයේ,
    (1) ස්වේච්ඡා සංවිධාන වලට ය
    (2) රජයේ සේවකයන්ටයි
    (3) නිදහස් ජනමාධ්‍ය වලටයි
    (4) ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්ටයි

38. මිනීමැරීම් සම්බන්ධ නඩු විභාග කිරීමේ බලය ඇති අධිකරණය වන්නේ,
    (1) දිසා අධිකරණයයි
    (2) අභියාචනාධිකරණයයි
    (3) මහාධිකරණයයි
    (4) පළාත්බද අධිකරණයයි

39. පාරිසරික ගැටලු සම්බන්ධයෙන් පහත ප්‍රකාශ කියවන්න.
    A - ආසියා මහාද්වීපවල ස්වභාවික සම්පත් දියුණුරටවල අවශ්‍යතා සඳහා යොමු වී ඇත.
    B - පාරිසරික ගැටලුවලට ප්‍රධාන හේතුව වන්නේ සම්පත් අධිපරිභෝජනය නොවේ
    C - ස්වභාවික පාරිසරික ගැටලු එහි ක්‍රියාකාරීත්වයෙන්ම තුලනය කර ගනියි
    D - සංවර්ධනය වෙමින් පවතින රටවල සම්පත්වලට හොඳ මිලක් නොලැබීම දිළිඳුකම වර්ධනය වීමට ප්‍රබල සාධකයක් නොවේ.
    (1) AC නිවැරදියි
    (2) AB නිවැරදියි
    (3) CD නිවැරදියි
    (4) AD නිවැරදියි

40. අන්තර්ජාතික නීතිය අයත් නොවන්නේ,
    (1) තේසවලාමේ නීතිය
    (2) සාගර නීතිය
    (3) ආයෝජන නීතිය
    (4) පරිසර නීතිය

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Second Term Test – January 2022
දෙවන වාර පරීක්ෂණය - 2022 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය2
Time :2hours

| 62 | S | II |
|---|---|---|

## Civic Education – II
පුරවැසි අධ්‍යාපනය – II

Name :- ................................................... Grade : -................ Index number:-....................

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5කට පිළිතුරු ලියන්න.**

01. (i) නැගෙනහිර පළාතේ දිස්ත්‍රික් 2 නම් කරන්න.

(ii) කාන්තාවන්ට එරෙහි සියළුම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ අරමුණින් පිහිටුවා ගත් සම්මුතිය කුමක් ද?

(iii) ජෝන් ගැල්ටුන්ගේ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියේ ගැටුම් ඇතිවීමට බලපාන මූලික හේතු 2ක් ලියන්න.

(iv) ඡන්ද කොට්ඨාස අනුව ව්‍යවස්ථාදායකයට නියෝජිතයන් තෝරා පත්කර ගැනීමෙන් අත්වන වාසි 2ක් ලියන්න.

(v) ශ්‍රී ලංකාව බහුසංස්කෘතික රටක් වීමට ආක්‍රමණ බලපා ඇත. උදාහරණ 2ක් ලියන්න.

(vi) ධනවාදී අර්ථක්‍රමයක ලක්ෂණ 2ක් ලියන්න.

(vii) පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප 2 ලියන්න.

(viii) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණු 2ක් ලියන්න.

(ix) සමාජවාදී අර්ථක්‍රමය පවතින රටවල් 2ක් ලියන්න.

(x) 3R සංකල්පය නම් කරන්න.

02. (i) ඒකීය රාජ්‍යයක් යනු කුමක්ද? (ලකුණු 2)

(ii) ඒකීය රාජ්‍යයක ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) (අ) නූතන රාජ්‍යවල බලය බෙදාහැරීමට හේතු වූ කරුණු 2ක් ලියන්න (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීමට ගත් උත්සාහයක් සඳහන් කර එය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)

03. (i) පරිසර පද්ධතිය සකස් වී ඇති ජීවී සංරචකයක් හා අජීවී සංරචකයක් දක්වන්න. (ලකුණු 2)

(ii) පරිසරයෙන් ලැබෙන සේවා 3ක් සඳහන් කරන්න. (ලකුණු 3)

(iii) (අ) තිරසර සංවර්ධනයක් සඳහා ජයගත යුතු අභියෝග 2ක් ලියන්න. (ලකුණු 2)

(ආ) ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

04. (i) අර්ථක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 2)

(ii) නව ලිබරල්වාදී අර්ථක්‍රමයක ඇති ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) (අ) ගෝලීයකරණය යනු කුමක්ද? (ලකුණු 2)

(ආ) ගෝලීයකරණයන් ශ්‍රී ලංකාවට අත්වූ ධනාත්මක හා ඍණාත්මක බලපෑම් 1 බැගින් ලියා විස්තර කරන්න. (ලකුණු 3)

05. (i) අන්තර්ජාතික ගැටුම් යනු මොනවාදැයි හඳුන්වන්න. (ලකුණු 2)

(ii) ගැටුම් ඇතිවූ මූල 2ක් ලියන්න. (ලකුණු 3)

(iii) (අ) ගැටුම් නිරාකරණය කරනු ලබන ක්‍රම අතර අධිකරණය සම්බන්ධ වන ගැටුම් නිරාකරණය ක්‍රමය නම් කර එය හඳුන්වන්න. (ලකුණු 2)

(ආ) ගැටුම් නිරාකරණයේදී පුරවැසියකු සතුවිය යුතු ගුණාංග (ලකුණු 3)

06. (i) ආණ්ඩුවේ ප්‍රධාන අවයව 2ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) ප්‍රජාතන්ත්‍රවාදය ඔබට පාසලේ දී වුවද ජීවන ක්‍රමයක් ලෙස වැදගත් වේ. එවැනි අවස්ථා 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) (අ) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ 2ක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් ලියා එය විස්තර කරන්න. (ලකුණු 3)

07. (i) ශ්‍රී ලංකාවේ පළාත් පාලන පිහිටුවීමේ අරමුණු 2ක් ලියන්න. (ලකුණු 2)

(ii) පළාත්පාලන ආයතන 3 නම් කරන්න. (ලකුණු 3)

(iii) (අ) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති තේමා 2 සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ඉන් එක් තේමාවකට අයත් කාර්යයන් විස්තර කරන්න. (ලකුණු 3)